www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජනාධිපතිනිය යලිත් ව්‍යවස්ථාවට පිටින් ක්‍රියාත්මක වෙයි

**Sri Lankan president resorts to another extra-constitutional measure**

**කේ. රත්නායක විසිනි**
**2004 ජූනි 19**

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව යටතේ, රටේ ජනාධිපති, පාර්ලිමේන්තුවේ එක් එක් හය වසරක කාල පරිච්ඡේදයක් ආරම්භයේ දී ද ඉන් පසුව සෑම වසරක ම පාර්ලිමේන්තු සැසියක් ආරම්භයේ දී ද පාර්ලිමේන්තුවේ දී ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කෙරෙතැයි අපේක්ෂා කෙරේ. ආන්ඩුවේ වැඩපිලිවෙලේ කාබන් පිටපතක් ලෙස සැලකෙන, මෙම කතාව, විවාදයට ලක් කොට එය පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිනිස ඡන්දයක් විමසනු ලැබේ.

කෙසේ වෙතත්, පසුගිය සති අන්තයේ දී, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග, සම්ප්‍රදාය ද ව්‍යවස්ථාව ද උල්ලංඝනය කරමින්, "ආන්ඩුවේ පිලිවෙත් සහ අනාගත ක්‍රියාමාර්ගික සැලසුම්" පිලිබඳව ජාතික රූපවාහිනියෙන් විකාශනය කෙරුනු කතාවක් කලා ය. පාර්ලිමේන්තුව මග හැරීම මගින්. ඇය විවාදයක් ද ඡන්දයක් ද වලකා ගත්තා ය. පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයට (එජනිස) පාර්ලිමේන්තු බහුතරයක් නොමැති නිසා, කුමාරතුංගගේ කතාව අනුමත වෙයි ද යන්න පිලිබඳව කිසිදු සහතිකයක් නැත.

කුමාරතුංගගේ උපාමාරුව, ඇගේ හෙලෙත්තාඩු සුලුතර ආන්ඩුවට මුක්කු ගසා ගනු පිනිස, ව්‍යවස්ථාමය හා පාර්ලිමේන්තු රීති නො තකා කටයුතු කිරීමට ඇය දක්වන කැමැත්ත තව දුරටත් පෙන්නුම් කිරීමකි. පාර්ලිමේන්තු අවුල් වියවුල් ජාලයකට ඇද වැටෙන තතු තුල, ඇය වඩවඩා සෘජුව බලය සියතෙහි ගොනු කර ගනී.

පෙබරවාරියේ දී, කුමාරතුංග, පෙර පැවති එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව බලයෙන් පහ කලේ, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ගෙනගිය සාම සාකච්ඡාවල දී එය ජාතික ආරක්ෂාවට වල කපමින් සිටින බව කියාපාමිනි. ඇගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප), අප්‍රේල් 2 මැතිවරනයට තරග කරනු පිනිස, සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ තවත් කුඩා පක්ෂ කිහිපයක් සමග එක්ව, එජනිස තැනී ය. එජනිස වැඩිම ආසන සංඛ්‍යාව — 105 — දිනාගත් නමුත් සභිකයන් 225කින් යුත් පාර්ලිමේන්තුවේ බහුතරයක් සඳහා එය ප්‍රමානවත් නො වී ය.

මැතිවරනයේ සිට මේ දක්වා පාර්ලිමේන්තුව රැස්වී ඇත්තේ දින හතරක් පමනි. එම දින හතරම ආකාරගත කටයුතුවලින් යුක්ත විය — කතානායක හා සෙසු නිලධාරීන් පත් කිරීම වැනි. එහෙත් සෑම අවස්ථාවක් ම අවසන් වූයේ, විපාර්ශ්වික බහුතරය මහහැරීමට උත්සාහ කරමින් පාලක සභාගයේ සාමාජිකයන් විසින් අවුලුවන ලද ගාලගෝට්ටිවලිනි. මෙම ගැටුම් තුඩු දී ඇත්තේ, රටේ පාලක ප්‍රභූව තුල පවත්නා තියුනු භේදයන් තව දුරටත් ගැඹුරු වීමට ය.

තිරයට පිටුපසින්, කුමාරතුංග සහ ඇගේ ඇමතිවරු, සෙසු පක්ෂ සමග ප්‍රචන්ඩ කේවලක යෙදී සිටියහ. ජූනි 8 දා පාර්ලිමේන්තුවේ සිවු වන රැස්වීම් දිනයට ආසන්න වන විට ආන්ඩුවේ නායකයන් පුරසාරම් දෙඩුවේ, තමන් සභා ගර්භය තුල බහුතරයක් පෙන්වන බවයි. ඔවුන් බලාපොරොත්තු තැබුවේ, දක්ෂිනාංශික ජාතික හෙල උරුමයේ (ජාහෙඋ) මන්ත්‍රීවරු දෙදෙනකුගේ සහ එජාපෙ සමග සන්ධානගතව සිටින ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරු හතර දෙනෙකුගේ සහයෝගය මත ය.

අප්‍රේල් 2 දා මැතිවරනයේ ප්‍රථම වතාවට ආසන නවයක් දිනාගත් හෙල උරුමය මෙයට ප්‍රතිචාර දැක්වූයේ, තම පක්ෂයේ ආන්ඩුවට ගැති මන්ත්‍රීවරුන්ගෙන් එක අයෙකුට ඉල්ලා අස්වීමට බල කිරීම මගිනි. එහෙත් ඔහු වෙනුවට පත් කල මන්ත්‍රීවරයා දිවුරුම් දීම වලකන උසාවි නියෝගයක් ලබා ගනු පිනිස එජනිස එම මන්ත්‍රීට සහයෝගය දුනි. ජූනි 8 දා පාර්ලිමේන්තු රැස්වීමේ දී ගැටලු ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගත යුතු මට්ටමට වර්ධනය වී තිබුනි. උසාවි නියෝගය ලැබී නො තිබූ බැවින්, විපක්ෂය විසින් පත් කෙරුනු, කතානායක, හෙල උරුමයේ නව මන්ත්‍රීවරයාට දිවුරුම් දීමට ඉඩ දුනි. ශ්‍රීලනිප හා ජවිපෙ පාර්ලිමේන්තු සභිකයන් එම ක්‍රියාව ශාරීරිකව වැලැක්වීමට උත්සාහ කිරීමත් සමග ම, ඒ අනුව කලබැගැනියක් හටගැනුනි. එවිට පාර්ලිමේන්තුව ජූලි 20 දිනට තවත් මසකින් කල් තබන ලදි.

කොලඹ මාධ්‍ය තුල කලහය පිලිබඳ කෙරුනු පුලුල් විවේචන මධ්‍යයේ. කුමාරතුංග එම නො හික්මුනු හැසිරීම "හෙලා දැකි" නමුත් එයට සම්බන්ධ වූ කිසිවකුට හෝ එරෙහිව කිසිදු පියවරක් ගත්තේ නැත. කලහකාරී පාර්ලිමේන්තු රැස්වීමට දින හතරකට පසුව,

තවමත් බහුතරයක් නැති තතු යටතේ, ජනාධිපතිනිය සිය ප්‍රතිපත්ති කතාව කිරීමට මාධ්‍ය යොදා ගත්තා ය. එහි අන්තර්ගතය ඇගේ ආන්ඩුව ඉරි තැලීමට තුඩු දී ඇති ප්‍රතිවිරෝධතා තව දුරටත් අවධාරනය කලේ ය.

පසුගිය මාස දෙක තිස්සේ, කුමාරතුංගගේ ගැටලු අනවරතයෙන් ම ගොඩගැසෙමින් පැවතී ඇත. රට ස්ථාවර කොට එය ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කරනු පිනිස එල්ටීටීඊය සමග සාම සම්මුතියක් ඇති කරගන්නා ලෙස මහ බලවතුන්ගෙන් එල්ල වන පීඩනයට ඇය මුහුන දී සිටී. ජූනි මස මුල බ්‍රසල්ස්හි හමුවූ, එක්සත් ජනපදය, යුරෝපීය සංගමය සහ ජපානය ඇතුලු ආධාර දෙන රටවල්, එක්සත් ජනපද ඩොලර් බිලියන 4.5ක් ආධාර මුදල් ලබා දීමට නම් "සාම ක්‍රියාදාමය" යලි ඇරඹීම අවශ්‍ය බවට අනතුරු ඇඟවූහ.

මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුන දී සිටින තතු යටතේ, එජනිස ආන්ඩුව නය සහ මූල්‍ය ආධාර අවශ්‍යතාවයෙන් දැඩි ලෙස පෙලෙයි. එහෙත් සාම සාකච්ඡා සම්බන්ධයෙන් එය ගෙන ඇති අංශක 180ක හැරීම, මීට යන්තම් මාස කිහිපයකට උඩ දී එල්ටීටීඊයට රට පාවා දෙන්නේ යැයි ආන්ඩුව හෙලා දැක්කා වූ, සභාගය තුල භේදයන් ඉස්මත්තට ගෙනවිත් තිබේ. දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වල අන්තර් ස්වයං-පාලන අධිකාරියක් (අයිඑස්ජීඒ) පිහිටුවීම පිලිබඳ සිය යෝජනාව මත සාකච්ඡා පදනම් විය යුතු ය යනුවෙන් එල්ටීටීඊය ඉදිරිපත් කර ඇති ප්‍රධාන ඉල්ලීමට ජවිපෙ එරෙහි වී ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, සාම සාකච්ඡා පිලිබඳ කුමාරතුංගගේ නිවේදන නාටකාකාර ලෙස වෙට්ටුදැමීම්වලින් පිරී පවතී. මැයි මුල දී, ඇය සාකච්ඡා යලි අරඹන ලෙස නෝර්වේජියානු ආන්ඩුවට හදිසියේ ම ආරාධනා කලා ය. කලින් අතරමැදියකු ලෙස ක්‍රියා කොට ඇති නෝර්වේ, "එල්ටීටීඊ ගැති" ලෙස ක්‍රියා කරතැයි කියමින් ජවිපෙ හා සෙසු සිංහල අන්තවාදී කන්ඩායම් දැඩි විවේචන එල්ල කලහ. ජවිපෙ විවේචනවලට මුහුන දුන් තතු යටතේ, කුමාරතුංග නෝර්වේජියානු නිලධාරීන් සමග සාකච්ඡා පැවැත්වූ නමුත්, සාකච්ඡා සඳහා න්‍යාය පත්‍රයක් සැකසීමටත් ඒ සඳහා දිනයක් නිවේදනය කිරීමටත් ඔවුනට අවසර දීම ප්‍රතික්ෂේප කලා ය.

ජූනි 8 දා පාර්ලිමේන්තුවේ දී අසාර්ථකත්වයෙන් පසුව කුමාරතුංග, එල්ටීටීඊය සමග පෙලගැසී සිටින දෙමල පක්ෂවල සන්ධානයක් වන දෙමල ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) නායකයන් සමග සාකච්ඡා පැවැත්වූවා ය. අයිඑස්ජීඒ පිලිබඳව සාකච්ඡා කල යුතු ය යන එල්ටීටීඊයේ ඉල්ලීම ඉටු කිරීමට ජනාධිපති පොරොන්දු වී ඇතැයි, ටීඑන්ඒ නායක ආර්. සම්බන්ධන් මාධ්‍යවලට පැවසී ය. වහාම රැස්වූ ජවිපෙ දේශපාලන කමිටුව, අයිඑස්ජීඒ පිලිබඳ සාකච්ඡා ඉදිරියට ගෙන ගිය හොත් "දැඩි ක්‍රියාමාර්ග" ගන්නා බවට අනතුරු අඟවමින් ජනාධිපතිට ලිපියක් යැවී ය.

පසුගිය සති අන්තයේ කල කතාවේ දී, ජනාධිපතිනිය අඩියක් පස්සට ගෙන, කිසිවක් තීන්දු කොට නැතැයි ප්‍රකාශ කලා ය. "දෙපාර්ශ්වය තවමත් යෙදී සිටින්නේ සාම සාකච්ඡාවල ඊලඟ වටයේ තේමාව සැකසීමෙහි ය." යනුවෙන් ඇය පැවසී ය. ඇගේ ප්‍රකාශය එල්ටීටීඊය වෙතින් කෝපාවිෂ්ඨ ප්‍රතිචාරයක් ප්‍රකුපිත කලේ ය. ඇගේ පෙර පොරොන්දුව කඩ කොට ඇතැයි කුමාරතුංගට චෝදනා කල එල්ටීටීඊය, ඇගේ "දෙපිටකාට්ටුකම" හෙලා දැක්කේ ය. සාකච්ඡා නිමක් නැතිව ප්‍රමාද වන්නේ නම් යලි යුද්ධයක් ඇති වෙතැයි අනතුරු ඇඟවූ එල්ටීටීඊය, කොලඹ ආන්ඩුව සාකච්ඡා කරා තල්ලු කරන ලෙස "ජාත්‍යන්තර ප්‍රජාව" ගෙන් ඉල්ලා සිටියේ ය.

එල්ටීටීඊය තමන්ගේ ම සංවිධානය තුල ප්‍රධාන භේදයකට ද මුහුන දී සිටී. අප්‍රේල් 2 දා මැතිවරනය ආසන්නයේ දී, කරුනා නමින් වඩා ප්‍රසිද්ධ, එහි නැගෙනහිර මිලිටරි අන දෙන නිලධාරි වී. මුරලිදරන්, තනතුරු හා සම්පත් මත ඒකාධිකාරයක් පවත්වාගෙන යන බවට "උතුරේ" නායකත්වයට චෝදනා කරමින්, සංවිධානයෙන් බිඳුනි. අප්‍රේල් මාසයේ දී, මඩකලපු-අම්පාර ප්‍රදේශ යලි සිය පාලනය යටතට ගැනීමට එල්ටීටීඊය සමත් වූ නමුත්, කන්ඩායම් දෙක අතර සිදුවන ඝාතන හා අඩු මට්ටමේ සටන් පිලිබඳව දිගටම වාර්තා වේ. එක්තරා දුරකට, එල්ටීටීඊයට සාකච්ඡා හා ඔවුනගේ ආධිපත්‍යය යටතේ පවතිනු ඇති, අන්තර් ස්වයං-පාලන අධිකාරියක් තහවුරු කිරීමක් අවශ්‍ය වන්නේ, උතුරු හා නැගෙනහිර පලාත්වල සිය දේශපාලන අධිකාරිය වඩා සඵල ලෙස පැනවීම පිනිස ය.

එමෙන් ම, නව ආන්ඩුව, ජීවන මට්ටම්වල අඛන්ඩ කඩාවැටීම සම්බන්ධයෙන් නැගෙන මහජන අසන්තෘප්තියට ද මුහුන දී සිටී. පසුගිය සති කිහිපය තුල, සහල් ඇතුලු මූලික භාන්ඩවල මිල ගනන් තියුනු ලෙස ඉහල නැග ඇත. කොලඹ පාරිභෝගික මිල දර්ශකය, මැයි මාසය තුල පමනක්, 3,598 දක්වා, ඒකක 120කින්, නැත හොත් සියයට 3.5කින් පිම්මේ ඉහල නැංගේ ය.

මැතිවරන ව්‍යාපාරය තුල දී, එජාපෙ ආන්ඩුවේ ආර්ථික ප්‍රතිසංස්කරන හෙලාදැකීම සහ එහි පිලිවෙත් ආපසු හැරවීමට පොරොන්දු වීම මගින්, මහජන අසන්තෘප්තිය ගසාකෑමට එජනිස සමත් විය. දැන් බලයේ සිටින තතු තුල, එජනිස, සිය පිලිවෙත් ක්‍රියාවට දැමීමට මූල්‍ය සම්පත් ද නොමැතිව, ආර්ථික ප්‍රතිව්‍යුහකරනය හා පුද්ගලීකරනය ඉදිරියට ගෙන යන ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව වෙතින් එල්ල වන පීඩනයට ද මුහුන දී සිටී.

මේ සතියේ දී, සෞඛ්‍ය අංශයේ වෘත්තීය සමිති, සැලකිය යුතු වැටුප් වැඩිවීමක් ලබා දෙන ලෙසත් නැත හොත් දිවයින පුරා ම බල පවත්වන දින නියමයක් නැති වර්ජනයකට මුහුන දෙන ලෙසත් කියමින් ආන්ඩුවට අවසාන නිවේදනයක් නිකුත් කලේ ය. බහු

ජාතික බාටා සමාගමේ සේවකයන් ඇතුලු පුද්ගලික අංශයේ කම්කරුවෝ, අස් කරන සේවකයන්ට ගෙවනු ලබන වන්දි මුදල් අඩු කරමින් එජාපෙ ආන්ඩුව පැනවූ නීති සංශෝධනය කරන ලෙස ආන්ඩුවට බල කරමින් පසුගිය සතියේ උද්ඝෝෂනයක් දියත් කලහ.

ජූනි 17 දා උතුරේ යාපන නගරයේ, 15,000ක ජනකායක්, සාම සාකච්ඡා යලි ඇරඹීම සහ උතුරු හා නැගෙනහිර අධි ආරක්ෂක කලාප ඉවත් කිරීම ඇතුලු ඉල්ලීම් හතරකින් යුත් ඉල්ලීම් මාලාවක් ඉදිරිපත් කරමින්, විරෝධතා දැක්වූහ. මිලිටරිය විසින් පිහිටුවන ලද මෙම කලාපවලට, සැලකිය යුතු ප්‍රදේශ අයත් වන අතර. ඒවායේ සිටි දහස් ගනන් පවුල්වලට සිය නිවාස, ඉඩම් හා ව්‍යාපාරික ස්ථාන අතහැර යාමට බල කෙරී ඇත.

තව මසක් ඉක්මයාමට මත්තෙන්, කුමාරතුංග හා එජනිස පලාත් සභා 6ක් සඳහා පැවැත්වෙන තීරනාත්මක මැතිවරනවලට මුහුන දෙනු ඇත. තීරනාත්මක ජයක් විරුද්ධ පාර්ශ්වික මන්ත්‍රීවරු බාගැනීම සඳහා ඔවුනට උපකාරී විය හැකි නමුත් පරාජයක් ව්‍යසනකාරි වනු ඇත. ජාතික ආර්ථිකය හා සුලු ව්‍යාපාරිකයන් නගා සිටුවීම ගැන පූච්චානම්වලින්, සිය ස්වෝත්තමවාදී සගයා වන ජවිපෙ සනසන අතරතුරම, කුමාරතුංගගේ කතාව හැඩගැස්වුනේ, මහජනතාව රැවටීම පිනිස ය. එජනිසයට පවත්නා ගැටලුව නම්, සාමාන්‍ය වැඩ කරන ජනයා අතර, සමස්තයක් ලෙස දේශපාලන සංස්ථාපිතය ම සම්බන්ධයෙන්, පුලුල් අවිශ්වාසයක් පැවතීමයි.

විපාර්ශ්වික එජාපෙ, ආන්ඩුවේ ගැටලු තව දුරටත් උග්‍ර කිරීමට කටයුතු කරයි. එය හෙල උරුමයට වඩා සමීප වීම පිනිස පාර්ලිමේන්තුවේ කෝලහාලය යොදාගෙන තිබේ. දැන් ඒකාබද්ධ විපක්ෂයක් තනාගෙන එයට පාර්ලිමේන්තුවේ බහුතරයක් තිබෙන බව ඔප්පු කරනු පිනිස අත්සන් 117ක් එකතු කරගෙන ඇත. එම ලැයිස්තුව කතානායකට භාර දීමට නියමිත ය. විශ්වාස භංග යෝජනාවක් ගෙන විත් ආන්ඩුව පෙරලා දැමීමේ ක්ෂනික සූදානමක් නැති නමුත්, එම තර්ජනය කුමාරතුංග හා එජනිසය ඉදිරියේ නියත වසයෙන් ම පවතී.

කුමාරතුංග කෙසේ හෝ බලයේ රැඳී සිටීමට උත්සාහ කරයි. පාර්ලිමේන්තුවට පිටතින් ක්‍රියාත්මක වන ව්‍යවස්ථා විරෝධී විධික්‍රම මගින් පාලනය කිරීමක් ඇගේ කතාව මගින් බලගතුව ඇඟවුම් කෙරුනි. "කාර්යක්ෂම ලෙස ආන්ඩුවේ කටයුතු ගෙන යාම සඳහා අවශ්‍ය මහජන බලය මෙන් ම නිපුනතාවන්ථ හැකියාව සහ ශක්තිය ද ආන්ඩුව සතුව ඇතැ" යි ඇය ප්‍රකාශ කලා ය. එහෙත් ඇය තව දුරටත් කියා සිටියේ, "පවත්නා මැතිවරන ක්‍රමය මගින් මහජනතාවගේ ඡන්දය අයුක්ති සහගත ලෙස මෙහෙයවීම හේතු කොට ගෙන පාර්ලිමේන්තුවේ බහුතරයක් තහවුරු කරගැනීමෙන්" එය "වලකනු ලැබ" ඇති බවයි.

සැම ඒකාධිපතියකු මෙන් ම, කුමාරතුංග ද පාර්ලිමේන්තු නියමයන් හා මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් පාගා දැමීම යුක්තියුක්ත කරනු වස් "මහජන බලය" පිලිබඳ සූත්‍රය යොදාගනියි. පාර්ලිමේන්තු දේශපාලනයේ විකෘතකරනයන් යටතේ පවා, "මහජනතාව" වෙනුවෙන් කතා කරන බවට ජනාධිපති කරන කියාපෑම් පැහැදිලිවම සාවද්‍ය ය. රටේ සමානුපාතික මැතිවරන ක්‍රමය යටතේ, එජනිස පාර්ලිමේන්තු ආසන 225න් 105ක් දිනා ගති. එය වනාහි එය ලබා ගත් ඡන්ද ප්‍රමානයට — යන්තම් සියයට 37.5ක් — වඩා ඉහල අනුපාතිකයකි.

ජවිපෙ පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් ඊටත් වඩා විවෘතව අවඥා සහගත ආකල්පයක් ගන්නා අතර ජූනි 8 දා පාර්ලිමේන්තු රැස්වීමේ ඇති වූ කෝලහාලයෙහි කේන්ද්‍රීය ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. මාඕවාදය හා කැස්ත්‍රෝවාදය මත පදනම්ව 1960 ගනන්වල දී ගොඩනගන ලද ජවිපෙ, 1980 ගනන් අග කම්කරුවන් හා දේශපාලන විරුද්ධවාදීන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් කුප්‍රකට ය. මහජන අසන්තෘප්තිය සඳහා ප්‍රයෝජනවත් ආරක්ෂක කපාටයක් ලෙස 1990 ගනන්වල දී නීත්‍යානුකූල කෙරුනු ජවිපෙ, ජනතාවාදී වාචාලත්වයේ හා සිංහල ස්වෝත්තමවාදයේ මිශ්‍රනයක් මත පදනම්ව, අප්‍රේල් 2 දා මැතිවරනයෙන් සැලකිය යුතු වාසි ලබා ගැනීමට සමත් විය.

ප්‍රථම වතාවට ආන්ඩුවට එක්වී සිටින ජවිපෙ, දැන් අත්දකින්නේ, සිංහල-බෞද්ධ ධර්ම රාජ්‍යයක් තැනිය යුතු යයි කියා සිටින හෙල උරුමය විසින් සිය ස්වෝත්තමවාදී ගර්ජනය අත්පත් කරගෙන සිටින බවයි. එල්ටීටීඊයට රට පාවා දෙන්නේ යයි කියමින් එජාපෙ හෙලා දැකි ජවිපෙ වාචාලයන්ට විරුද්ධව, සියල්ලන්ම බෞද්ධ භික්ෂූන් වන, හෙල උරුමය මන්ත්‍රීවරු විසින් එම චෝදනාවට එල්ල කරනු ලැබේ. ජවිපෙ එයට ප්‍රතිචාර දක්වා ඇත්තේ, පාර්ලිමේන්තුව තුල ප්‍රකෝපකාරී හා මැර ක්‍රියාවන්හි නිරතවීම මගිනි. ඒ සියල්ලම කලේ ද "මහජනතාවගේ" නාමයෙනි. එමගින් ඔවුනගේ ෆැසිස්ට් දුර්ගන්ධයට වඩා වැඩි මනත් යමක් පෙන්නුම් කරයි.

ජනාධිපතිගේ පුලුල් විධායක බලතල අහෝසි කොට පාර්ලිමේන්තු ක්‍රමය කරා යලි පරිවර්තනය වීම පිනිස ව්‍යවස්ථාව වෙනස් කිරීමට එජනිසය කටයුතු කරනු ඇතැයි, මැතිවරන ව්‍යාපාරය තුල දී, කුමාරතුංග ප්‍රකාශ කලා ය. මෙම යෝජනාව වනාහි, පාර්ලිමේන්තුවේ අගමැතිවරියක ලෙස දිගටම බලයේ රැඳී සිටීමේ අවසරය කුමාරතුංගට ලබා දීම පිනිස, විධායක ජනාධිපති ක්‍රමයට එරෙහි වෛරය යොදාගැනීමේ පැහැදිලි ප්‍රයත්නයකි. වත්මන් ව්‍යවස්ථාව යටතේ, තෙවන වතාවට ජනාධිපති තනතුර සඳහා තරඟ කිරීම ඇයට කල නො හැකි ය.

කුමාරතුංග පසුගිය සති අන්තයේ පැවැත්වූ කතාවේ දී, මෙම කාරනාව යලිත් මතු කලා ය. එහෙත් පාර්ලිමේන්තුවේ බහුතරයක් නැති තතු යටතේ, යෝජිත සංශෝධන ගෙනඒම පිනිස පාර්ලිමේන්තුව ව්‍යවස්ථා

සම්පාදක මන්ඩලයක් බවට පරිවර්තනය කිරීමේ ඇගේ සැලසුම් පෙරට ගෙනයාමෙහි ලා ඇය අපොහොසත් ය. සරල බහුතරයක් සහිතව එසේ කිරීමේ ඇගේ සැලසුම් පවා, ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වනු ඇත. ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් කෙරෙන්නේ, ඒ සඳහා තුනෙන් දෙකක පාර්ලිමේන්තු බහුතරයක් අවශ්‍ය බව ය.

ව්‍යවස්ථාව නො තකා කටයුතු කිරීම සඳහා යුක්තිකරනය සම්පාදනය කිරීමට ජවිපෙ උත්සාහ දරයි. “ජන බලය දියවන්නාවට යට කල හැකි ද?” යන මැයෙන් ඔවුහු ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කර ඇත.

“ජන බලයට” කෙරෙන මෙම ආයාචනාවල අර්ථභාරය පිලිබඳව කිසිවකුත් කිසිදු සැකයක් ඇති කර ගත යුතු නැත. කුමාරතුංග වත් ජවිපෙ වත් ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ හා පීඩිත මහජනතාවගේ අවශ්‍යතා නියෝජනය නො කරයි. ව්‍යවස්ථාවට පිටින් කටයුතු කිරීම පිලිබඳ මෙම සාකච්ඡාව මගින් පිලිඹිබු කෙරෙන්නේ, පාර්ලිමේන්තුවේ දැන් පවත්නා හිරවීමක තතු යටතේ, පාලක පන්තියේ කොටස්වල අපේක්ෂාභංගත්වයයි.

කුමාරතුංග හා ඇගේ හවුල්කරුවන් විසින් වඩා ආඥාදායක පාලන රූපයක් දෙසට ගැනෙන ඕනෑම පියවරක්, නො වැලැක්විය හැකි ලෙස ම එල්ල කෙරෙනු ඇත්තේ, සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ ජීවන තත්වයන්ට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව ය.

© www.wsws.org